2021 OCT
07
LANKA YOUTH CHAT
LANKAYOUTH.COM
Youth en Vogue



# වෘත්තියෙන් නිවේදිකාවක් වුණත් මම නිරූපණයේ නියැලෙන්නේ මගේ සමේ පැහැයට අභියෝග කරපු පිරිස නිසා







## ISHARA DILINI DISSANAYAKE

**බලංගොඩ වැනි සුන්දර ප්‍රදේශයෙකින් කොළඹ පුරවරයට පැමිණ, දිවයිනේ ජනප්‍රියතම මාධ්‍ය නාලිකාවක නිවේදිකාවක් වශයෙන් සති අන්තයේදී ඔබගේ නිවසට පැමිණෙන අතරතුර නිරූපණ කටයුතුවලත් නියැලෙන තමන්ගේ සමේ පැහැයට අභියෝග කළ පිරිසට අභියෝගයක් වෙමින් සාර්ථක ගමනක් යන දැකුම්කළු සුන්දර යුවතියක් මෙවර ලංකායූත් චැට් සමගින් එකතු කර ගත්තා. ඇය නමින් ඉෂාරා දිලිනි දිසානායක. මේ ඇයගේ කතාවයි.**

**මුලින්ම කියන්න කොවිඩ් අතර මාධ්‍ය ජීවිතය කොහොමද?**

මේ දවස්වල ඉතින් කොවිඩ් කියලා ගෙදර හිටියේ නෑ ඇත්තටම. අපි වැඩසටහන්වලට තමයි යන්නේ. ඉතින් පරිස්සමෙන් මේ දවස්වල ඔෆිස් යනවා ගෙදර එනවා... ඒ විදිහට තමයි ඉතින් පසුගිය කාලය ගෙවුණේ.

**මාධ්‍ය ජීවිතයේදී කොවිඩ් කියලා නිවාඩුවක් ලැබුණේ නෑ. ඒ ගැන මොන වගේ අදහසක්ද තියෙන්නේ.**

ඇත්තටම දෙරණ ගැන කතා කරද්දි... අපිව රැකගන්න අපේ ඉහළ කළමනාකාරිත්වය විශාල වැඩකොටසක් කරනවා. නිවාඩු ගැන කතා කරනවා නම්.... ඇත්තටම කොවිඩ් වසංගත තත්ත්වයත් සමගින් හැමෝම වගේ ලොකු පසුබෑමකට ලක්වුණානේ.... තමන්ගේ රැකියාව කර ගන්න බැරිව... ඉතින් එහෙම තියෙද්දි මං හිතනවා මේ කාලේ අපේ ශ්‍රාවකයින්ට වචනයකින් හරි එයාලාට කතාකරන්න ලැබුණු එක ලොකු සතුටක් කියලා. එයාලා හැම තිස්සෙම අපිට කියන්නේ ඔයාලා නිසා තමයි අපි මේ විදිහට තමයි අපි මයින්ඩ් එක රිලැක්ස් කර ගන්නේ කියලා.

**කොවිඩ් කාලේ ගෙදර ආවේ නැහැ කියලා ගෙදරින් දෝෂාරෝපණ එහෙම නැත්ද?**

ඒක නම් ඇත්තටම කියලා වැඩක් නෑ... අම්මා හැමතිස්සෙම කතා කරලා බනිනවා එන්නේ නැත්ද මොනවද කරන්නේ කියලා. ඒත් ඉතින් ගෙදර යන්න ආසාව තිබුණත් ගෙදර යන්න වාහනයක් නෑ. ඒ නිසා ඉතින් එයාලාත් ඉවසගෙන හිටියා.. අපිත් ඉවසගෙන හිටියා.

**ඔබ කුමන කාලයේදී ද මාධ්‍ය ක්ෂේත්‍රයට එකතු වෙන්නේ.**

මම මාධ්‍යයට එකතු වෙන්නේ 2015 යාත්‍රා රේඩියෝ එකත් එක්ක. යාත්‍රා කියන්නේ කලින් මැක්ස් ආයතනය. ඊට පස්සේ මම රිදම් වාර්ල්ඩ් එකේ වැඩ කරනවා. ඊට අමතරව යාල් ටී.වී. එකෙත් වැඩසටහන් ඉදිරිපත් කරන්නියක් ලෙසින් වැඩ කළා. ඊට පස්සේ 2018දී තමයි දෙරණට එකතු වෙන්නේ. එතැන් සිට අද දක්වා දිගටම වැඩකරගෙන යනවා.

**දෙරණ හි ඔබ කරන වැඩසටහන ගැනත් කියමුද?**

එෆ්.එම්. දෙරණ රේඩියෝවේ සති අන්ත රික්වස්ට් ෂෝ එකක් කරන්නේ. ඒක සෑම සෙනසුරාදාම සවස 1 සිට 4 දක්වා තමයි තියෙන්නේ. ඉතින් අහන්න කියලා හැමෝටම ආරාධනා කරනවා.

**මාධ්‍යට එන්න අඩිතාලම දාගත්තේ කොහොමද?**

ඇත්තටම පාසල් යන කාලේ ඉඳන්ම මට පිස්සුවක් තිබ්බා ප්‍රවෘත්ති ඉදිරිපත් කරන්නෙක් වෙන්න. එතැනදී ජාතික රූපවාහිනියේ මුතුහර ළමා සමාජයත් එක්ක එකතුවෙලා වැඩ කළා. ඒකේ වැඩ කරද්දි ජාතික රූපවාහිනියේ දසත ළමා පුවත් කිව්වා. ඒවගේම එහිදී මට සුරම්‍යා මාපිටිය මිස්... එයාගෙන් තමයි මම ඉස්සෙල්ලාම මාධ්‍ය ගැන ඉගෙන ගන්නේ. ඒ වෙද්දි මම ඉස්කෝලේ 9 වසරේ හිටියේ... ඒ අනුව තමයි මුලින්ම ක්ෂේත්‍රයට එන්න පියවර තබන්නේ... මම බලංගොඩ ප්‍රදේශයේ. ඉතින් අපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබුණා ළමා සභාව කියලා එකක්. ඒකට යනවා.. ඉතින් ඒ විදිහට තමයි පටන් ගන්නේ. ඊට පස්සේ මම බෙල්වුඩ් සංස්කෘතික මධ්‍යස්ථානයෙන් බටහිර සංගීතය ඉගෙන ගත්තා. මොකද මට මෙච්චර ලස්සන කටහඬක් හම්බවෙන්න ලොකු හේතුවක් වෙන්න ඇති මං සංගීතය කරපු එකත්.

**නිවේදිකාවක් වශයෙන් කටයුතු කරන ඔබ මොඩලින්වලත් නියැලෙනවා. ඒ විනෝදාංශයක්ද? ඉතින් ඒ ගැනත් කියමුද?**

විනෝදාංශයක් කියලා කියන්නත් බැහැ. රූපවාහිනිය ඔස්සේ ෆැෂන් ෂෝ වගේ ඒවා යද්දි මට මාරම ආසාවක් ආවා. ඊට පස්සේ මම මොඩලින් කරන්න පටන් ගත්තේ 2014 වගේ. මම නුවර තමයි බෙල්වුඩ් යන්න කලින් මම මොඩලින් ක්ලාස් එකකට ගියා හේලි පෙරේරාගේ. එයා ලංකාවේ සුපර් මොඩල් කෙනෙක්. ඊට පස්සේ කොළඹ ඉද්දිදි නිලූ අක්කාගේ සහ අර්ජුන අයියාගේ ක්ලාස් එකට ගියා. ඒ විදිහට තමයි පොටෝෂූට්ස් එහෙම කරලා ක්ෂේත්‍රයට ආවා. ඒ විතරක් නෙවෙයි ගොඩක් අය කිව්වා ඔයා කළු කැතයි කියලා... ඒ වගේම මම පාසල් යන කාලේ අපිව හැල්ලුවට ලක් කළා. ඒ වගේ ගොඩක් අය මගේ මූණටත් කියලා තියෙනවා. මගේ ලොකු බලාපොරොත්තුවක් තියෙනවා... මොඩලින්වලින් ඉස්සරහටම යන්න...

**පැජන්ට්වලින් ලබා ඇති ජයග්‍රහණ ගැන කිව්වොත්.**

ඔව්... මං ඉස්සෙල්ලාම විශ්ව පෙරේරාව මතක් කරන්න ඕනි. එයායි අර්ජුන අයියයි... නිලූ අක්කයි සංවිධානය කරපු බෙස්ට් මොඩල් ඔෆ් ද වර්ල්ඩ් පැජන්ට් එකට තමයි මං මුලින්ම ගියේ. එතැනදි අවසන් දස දෙනා අතරට මං ආවා. ඊට පස්සේ ඩොක්ටර් ප්‍රසාද් දේශප්‍රියව මතක් කරන්න ඕනි සහ ඒ කාර්ය මණ්ඩලය... පී.ඩී. එන්ටර්ටේන්ට්මන්ට් ආයතනයේ කට්ටිය. ඒ තරගයේදී මට බෙස්ට් කැට්වෝල්ක් සහ බෙස්ට් මොඩල් ඇවෝර්ඩ් එක ලැබුණා.

**අවුරුදු දෙකකට ආසන්න කාලයක ඉඳලා නිරූපණ ක්ෂේත්‍රයේ දකින්න නැහැ. මොකක්ද හේතුව...**

හේතුව කියන්නේ මම ටිකක් අසනීප වෙලා හිටියේ. මට ලොකු කොන්දේ අමාරුවක් ආවා. ඇවිදගන්නත් අමාරු තත්ත්වයෙන්. ඒ නිසා අවුරුදු එක හමාරක් වගේ කිට්ටු වෙන්න බෙහෙත් කරන ගමන් හිටියේ. ඒ අතරතුර පුළුපුළුවන් විදිහට ෂූට් දෙක තුනක් කරපු ඒවා තිබ්බා. දැන් ආයේ වැඩ පටන් ගන්න තමයි හිතන්නේ.

**අලුත් පොටෝෂූට් එකක් කොයි කාලේ වගේද බලාගන්න පුළුවන්.**

මේ අවුරුද්ද ඉවර වෙන්න කලින් අලුත්ම ෂූට් එකක් බලන්න පුළුවන්. මොකද සංචාරක සීමා දැන් ඉවත් කරලා තියෙනවා. ඉදිරි දින කිහිපය තුළ අපි අලුත් ෂූට් කිහිපයක් කරන්න කටයුතු යොදාගෙන තිබෙනවා.

**නිරූපණයේදී සුදුස්සාට සුදුසු තැන ලැබෙනවද? මොකද මේ ගැන හිතන්නේ.**

ඒක ගැන මගේ අදහස ඇත්තටම... අපි පැජන්ට්වලදීත් දැකලා තියෙනවා... පොටෝෂූට්වලදිත් දැකලා තියෙනවා. සමහරක් වෙලාවට සුදුස්සාට සුදුසු තැන හම්බ වෙන්නේ නැහැ. ඒත් සමහර අය සමාජය කතාවෙන එක එක ආකාරයේ දේවල් කරලා ඉවර වෙලා ක්‍රවුන් එකක් අරගන්නවා ටයිටල් එකක් අරගන්නවා. අරගෙන හැබැයි තේරුම් ගත්තට පස්සේ හදාගන්නවා. සමහරක් අය එහෙමත් නෑ. එහෙම අය ක්ෂේත්‍රයට ආවාම තමයි මේ දේවල් වෙන්නේ... ඒ වගේම මොඩල් කරනවා කිව්වට පස්සේ ඒ මොඩල් කරන කෙනා දිහා බලන්නේ කැත හිතකින්... ඉතින් මට නම් කියන්න තියෙන්නේ ඇත්තටම හරි තැනකින් ඉගෙන ගෙන තමන්ගේ ෆිගර් එක හරියට මේටේන් කරගෙන තමන්ගේ ෆිගර් එක කැතැයි නම් තමන් ඒක හදාගෙන තමයි පොටෝෂූට් එකක් කරලා එළියට එන්න ඕන.



**සෙමි නියුඩ් එකක් හෝ නියුඩ් එකක් හෝ කිරීමට ඔබට ආරාධනාවක් පැමිණියහොත් ගන්නා තීරණය කුමක් වෙයිද?**

පළවෙනි දේ හිතනවා මගේ සිරුරය සෙමි නියුඩ්, නියුඩ්, බිකිනි එකක් අඳින්න මගේ ශරීරය ලස්සනයිද? එතකොට ඊළඟට මං බලන්න ඕනි ඒක කවුද කරන්නේ. ඒක ඇයි කරන්නේ. මොකක්ද ඒ මැගසින් එක. නැත්නම් කුමන අරමුණකින්ද කරන්නේ... ඒ හැමදේම සහ මට ලැබෙන ගෙවීම් කොහොමද? ඒකෙන් මට ලැබෙන දේ මොනවද? මොකද සමහර පොටෝෂූට් තියෙනවා අපට මුදල් ලැබෙන්නේ නැහැ. ඒත් ඒක අපට ආයෝජනයක් කළා වගේ. මොකද එය පළ වූ පසු අපට වෙනත් අය කතා කරලා එයාලාගේ ෂූට්වලට කතා කරනවා. ඉතින් මේවගේ මා සොයන දේ ඇතුළත එවැනි යෝජනාවක් ආවොත් සලකා බලන්න පුළුවන්.

**ඔයා ගැන පෞද්ගලික විස්තර ටිකකුත් කියන්න.**

මම ඉෂාරා දිලිනි දිසානායක. මගේ ගම බලංගොඩ. මගේ අම්මයි තාත්තායි ගෙදර ඉන්නවා. මට මල්ලිලා දෙන්නෙක් ඉන්නවා. මම පාසල් තුනකට ගියා. ඉස්සෙල්ලාම ගමේ පාසලට ගියා බලංගොඩ බුද්ධජයන්ති විද්‍යාලයට ගියා. ඒ විද්‍යාලයට යන්න කලින් හුණුවල මධ්‍ය මහා විද්‍යාලයටත් ගියා. එතකොට මගේ අවසන් පාසල තමයි බුද්ධ ජයන්ති විද්‍යාලය. ගුරුවරු හැමෝම මතක් කරන්න ඕනි. ගමට ගොඩක් ආදරෙයි. ගමේ කට්ටිය ගොඩක් මට... මම නිවේදිකාවක් කිව්වම... මම මොඩල් කෙනෙක් කිව්වාම මට පෝස්ට් හදලා එවනවා. කතා කරනවා. ගමට ගියාම අහනවා. විශේෂයෙන් මං ගැන කියනවා නම් මම වෘත්තීයමය වශයෙන් නිවේදිකාවක්. අමතරව මොඩලින් කරනවා. මගේ විනෝදාංශ විදිහට සින්දු කියනවා ඩාන්ස් කරනවා. මගේ පළමු ගීතය තවත් මාස දෙකකින් තුනකින් විතර රිලීස් කරන්න හිතන් ඉන්නවා. දැනට රෙකෝඩින් කරලා තියෙනවා.

**දිලිනි දැනට පෙම්වතියක්ද?**

ඔව්... පෙම්වතියක් තමයි...

**කැමතිද පෙම්වතා ගැන වගේම ආදරය ගැන කියන්න.**

ම්ම්ම්ම්.... පෙම්වතා ගැන නැතිව ආදරය ගැන කතා කරන්නම්. ආදරය ගැන කතා කරද්දි මං විශ්වාස කරන්නේ අපට 100%ක් ගැලපෙන මිනිස්සු මේ ජීවිතේ කවදාවත්ම මුණගැහෙන්නේ නැහැ. එහෙම හමුවෙනවා කිව්වොත් ඒක අමූලික බොරුවක්. දවසක මගේ පෙම්වතා කියනවා නම් ඔයා කොටට අඳින්න එපා දිගටම අඳින්න... ඔයා දිගට අඳින්න එපා... කොටටම අඳින්න කියලා... හැබැයි මම කැමති නැත්නම් ඒ විදිහට කරන්න එතැන තේරුම් ගැනීමත් එක්ක තමයි ඒ ප්‍රශ්නය විසඳගන්න ඕන. ඒකයි මං කියන්නේ අපි පෞද්ගලිකව ගත්තම අපේ ආශාවන් වෙනස්. හැබැයි මටත් තේරුම් අරන් ජීවිතේ ගෙනියන්න පුළුවන් කෙනෙක්ව හම්බ වුණා.

**කවුද උදව් උපකාර කරන්නේ සහ මොනවද අනාගත බලාපොරොත්තු.**

ස්තුති කරන්න නම් ගොඩක් අය ඉන්නවා. කෙටියෙන්ම කියනවා නම් ගෙදර අම්මා තාත්තා ඇතුළු පවුලේ සැමට එතකොට විශේෂයෙන් මතක් කරන්න ඕන හැම තිස්සෙම වචනෙකින් හරි බැනපු මිනිස්සුන්ට තමයි මුලින්ම ස්තුති කරන්නේ. මොකද ජීවිතයේ යම්කිසි දවසකදි ප්‍රතික්ෂේප වුණා නම් ඒ ප්‍රතික්ෂේපවීමම තමයි මං අද ඉන්න තැනට ගෙන ආවේ. මාව කොච්චර කැතැයි කිව්වද? අපහසුතාවයට පත් කළාද? අඬවන්න හැදුවද? පිටුපසට යැවීමට හැදුවද? ඒ හැමෝටම ස්තුතිවන්ත වෙන්න ඕන. මං හිතන්නේ මම පතපු තැනට 100%ක් ළඟා වුණා කියලා කියන්න බැහැ. නමුත් ඒ තැනින් හරි අඩකට මං ළඟා වෙලා තියෙනවා. මට තව ගොඩක් දුර යන්න තියෙනවා. ඉතින් ඒ නිසා මල් එවන අයට වගේම ගල් ගහන අයටත් ගොඩක් ස්තුතියි. ආදරෙයි හැමදාමත්.

අනුර ප්‍රේමකුමාර | පිටුසැකසුම Lankayouth.com

මෙවැනි ලිපියක් ලංකායූත් වෙබ් අඩවියේ පළ කරගැනීමට ඔබත් කැමතිනම් 0718 548 549 වට්ස්ඇප් අංකයට කතා කරන්න.